අපේක්ෂකයාගෙන් ගෙහිමියාට කනේ පහරක්, හේතුව 87-89 මතක් කිරීම" යන සිරස්තලයෙන් යුතුව, දිනමිණ පුවත්පතේ (පෙබ. 04, 2023) මුල් පිටුවේ පුවතක් පළ වී තිබිණි.

කෙසේ නමුත් මෙම පුවත ලියූ මාධ්‍යවේදියෙකුගේ නමක් සඳහන්ව නොතිබුණි. එසේම, ගල්ගමුව මීගලෑව ප්‍රදේශයේ අයෙකුට ජාතික ජන බලවේගයේ අපේක්ෂකයෙකු විසින් මෙසේ පහර දී ඇති බව හැරෙන්නට, මෙම සිදුවීම තහවුරු කරගත හැකි වෙනත් තොරතුරක් දැක්වී නොතිබුණි. එසේම, කිසිදු මූලාශ්‍රයක් ද දැක්වී නොතිබුණි.

මෙම පුවත් වාර්තාව සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළද කතාබහ ඇතිවී තිබූ අතර, එහිදී මෙම පුවතේ විශ්වසනීයත්වය ප්‍රශ්න කෙරී තිබිණි.

ඔබ සිතන ලෙසට,

1) පුවත ලියූ මාධ්‍යවේදියෙකුගේ නමක් හෝ, පුවත තහවුරු කරනා මූලාශ්‍රයක් හෝ, පුවත තහවුරු කරගත හැකි වෙනත් කිසිදු තොරතුරක් නොමැතිව පළ වී ඇති මෙම පුවත කෙතරම් විශ්වසනීය ද?

2) එසේ විශ්වසනීයත්වය පිළිබඳ පාඨකයා හට ගැටළු ඇතිවිය හැකි ආකාරයෙන් පුවත් පළ කිරීම, එම මාධ්‍යයේ විශ්වසනීයත්වයට ද හානියක් නොවන්නේ ද?

3) පුවතට වගකියන නිශ්චිත මාධ්‍යවේදියෙකුගේ නම නොමැතිව පළ වූ මෙම පුවතෙහි වගකීම, අදාළ පුවත්පතේ කර්තෘ මණ්ඩලය විසින් දරන්නේද?

